සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

තිත්ත කසායක්



ප්‍රකෘති / ප්‍ර - ක්ර් - ති, ක්ෂිතිජය/ ක් - ෂි - ති - ජ - ය, ප්‍රවුජ්‍යා/ ප්‍ර - වු - ජ - යා යන වචන බොහෝ දෙනාට කියවෙන්නේ ප්‍රකුර්තිය, සිතිජය, ප්‍රවුජ්‍යා යන විදියටය්. එසේම ගෘහය / ග්ර් -හය, වෘකයා / ව්ර් - කයා, පෘථිවිය/ ප්ර්ථි - විය, කෘත්‍රිම/ ක්ර්ත් - රිම, තෘණ / ත්ර්ණ, දෘෂ්ටිය / ද්ර්ෂ්ටිය, කර්තෲන් / කර් - ත්ර්ර්න් ආදි වචන කියවෙන්නේත් ද්රුස්ටිය, කර්ත්රූන් යන විදියටය්.

Cruze / ක්රූස් / ක්‍රූස්, Truman / ට්රූමන් / ට්‍රූමන් Andrew / ඇන්ඩ්රූ / ඇන්ඩ්‍රූ; Prunes / ප්රූන්ස්/ ප්‍රූන්ස්, Brook / බ්රූක්/ බ්‍රූක් යන වචන අප ලියන්නේ කෲස් /ක්ර්ර්ස්, ටෲමන් /ට්ර්ර්මන්, ඇන්ඩෲ /ඇන්ඩ්ර්ර්, පෲන්ස් / ප්ර්ර්න්ස් (මෙහි අකුරු පහ හල් කොට කිව යුතුය. බෲක් /බ්ර්ර්ක් (මෙහි අකුරු හතරම හල් කොට කිව යුතුය) යනුවෙනි. කෘ = ක්ර්, කෲත = ක්ර්ර්, ක්‍රැ = ක්රැ, ක්‍රෑ = ක්රෑ යනු නිවැරදි වියහර බව දන්නේ කීයෙන් කී දෙනා ද ? කැ = ක්ඇ උවත් රැ = ර්උ වන නිසා ර්ඇ ලියන්නට 'රැ' අමුතු ඇද පිල්ලක් ඇති වීමත් 'ර' (කාර) අංශය 'ක්ග්‍ර' යන විදියට ලිවීමේ ක්‍රමයත් මේ අවිලට හේතුවයි.

ය/2 ර/2 ල/2 ව/2 යන අන්තස්ත 4 න් ය/2 ලිවීම සඳහා පමනක් අකුරට පරව -ය" ක් යොදනු ලැබේ. ව්‍ය සනය = විය සනය, ව්‍යා කරන = වියා කරන, ව්‍යූ හය = වියූ හය යන වචන වල -ව" යන්නට පරව -ය" යෙදී ඇත.

'ය' යන්න හරි මැදින් දෙකඩ කොට පසු කඩ 'ය' කර ගෙන ඇතත්, ර/2 අංශය (ර කාර අංශය) හදගෙන ඇත්තේ ඉප්පිල්ල ි මුනින් ු හැරවීමෙනි. ක්‍රමය = ක්ර - මය, ග්‍රාමය = ග්රා මය, ග්‍රීසිය = ග්රී සිය යන වචන වල එය දැක්ක හැකිය.

"ර" යන්න "ය" යන්න මෙන් දෙකඩ කල නොහැකි නිසා ර(කාර) අංශය එසේ හද ගත්තා විය හැකිය. ල - ව දෙකට නම් කිසිම අංශයක් නැත. පෙර අකුරට හේත්තු කිරීමෙන් ල/2 ව/2 පිරිමසා ගනු ලැබේ. ශුක්ල, ක්ලාන්තය, ප්ලේටෝ, ග්ලිසරීන්, ක්ලෝරීන් වල 'ල' යන්නත් ත්වරනය, ද්වාරය, ස්වාමි, ස්වේද වල 'ව' යන්නත් පෙර අකුරට හේත්තු කරනු ලැබේ. මා මෙතෙක් වෑයම් කලේ සෘ / සෲ ස්වරවලත් 'ර' (කාර) අංශයේත් වෙනස තේරුම් කිරීම සඳහාය. සෘ = ර්, සෘ = ර්, සෲ = ර්ර්, ඏ = ල්, ඐ = ල්ල් යන විදියට කියවිය යුතුය. ඉරු / ඉරූ, ඉලු / ඉලූ යනු කියවීමේ පහසුව සඳහා අං, අඃ (අහ්) හද ගැනීම වැනි වැකියන්. මෙහි දී මතක තබා ගත යුත්තේ ඓ - ඖ - සෘ - සෲ - ඏ - ඐ යන ස්වර 4 ත් බැඳි අකුරුත් සියබසේ ලග නෑයන් නොවන බවයි. අය් - අව් - ර් - ර්ර් - ල් - ල්ල් යන විදියට ලිවීමෙන් කිසි අඩුවක් නැතිව ඒ හඬ ලබා ගත හැකිය.

අනෙක් ගැටය නම් අපේ හෝඩියට හිසරදයක් වී ඇති "ර" යන්නයි. ස්/ර්, සැ/රැ, සෑ/රෑ, සි/රි, සී/රී, සු/රු, සූ/රූ යන යුගලවල හල් ලකුනු (ස්/ර්) දෙකකි. ඇද පිලි (සැ/රැ) දෙකකි. ඉප්පිලි (සිරි) දෙකකි. උප්පිලි (සු/රු) දෙකකි. අනෙක් අකුරුවල "ඈ" ශබ්දය දීම සඳහා =යොදන "ැ" ඇප්පිල්ල -ර" යන්නට යෙදු විට ලැබෙන්නේ "උ" හඬයි. ඒ අනුව ක් ර = ක්‍ර, ක් රා = ක්‍රා, ක් රැ = ක්‍රැ, ක් රෑ = ක්‍රෑ යනුවෙනි ලියන්නේ. ක්‍රැ = ක්රැ, ක්‍රෑ = ක්රෑ යනුවෙනි කියවන්නේ. ක් රැ, ග් රැ, ට් රැ, ඩ් රැ , ත් රැ, ද් රැ, ජ රැ, බ් රැ වැනි ශබ්ද සකු මගද සහ සිංහල බාසාවල දක්නට නැත. සකු මගද බාසාවල බැඳි අකුරක් විදියටත්, සිංහල බාසාවේ හල් ලකුන බාවිතා කිරීමෙනුත් එය පිරිමසා ගනු ලැබේ.

ප්‍රැන්සිස් කියවිය යුත්තේ ප්රැන්සිස් යනුවෙන් මිස ප්රැන්සිස් යනුවෙන් නොවේ. ට්‍රැක්ට (ර්) කියවිය යුත්තේ ට්රැක්ට (ර්) යනුවෙන් මිස ට්රැක්ට(ර්) යනුවෙන් නොවේ.

බ්‍රැණ්ඩි කියවිය යුත්තේ බ්රැණ්ඩි යනුවෙන් මිස බ්රැණ්ඩි යනුවෙන් නොවේ. මේ ගැටලුවට තිරසාර විසඳුමක් සොයා ගත යුතුය. මුහුනේ හැදී ඇති 'ඉන්නා' පමා වී හෝ කපා ඉවත් කල යුතුය. කෙනකුට එය රැකගෙන ඊස මගම "වැලිගම්" යෑමට උවද බාදවක් නැත.

"ර" යන්නේ ඉහලට නැගී ඇති "වලග" පහලට නමා "හොඬේ" නැති "ත" යන්නක් නොහොත් මුනින් නැමු "6" ක් මෙන් ලියු විට (තැ) ර ැ, (තු)ර ු, (ති) ර ි) එක් ගැටයක් ලිහේ.

ය/2 = ය - යංශය මෙන් රංශයක් ලංශයක් සහ වංශයක් හද ගත් විට ලොකු බරක් බිමින් තැබු සේ දැනේ. අපි ය/2 යංශය සඳහා දැනට බාවිතයේ පවතින ය ලකුනත්, ර/2 රංශය සඳහා "6" ත් ල/2 ලංශය සඳහා "5" ත් ව/2 වංශය සඳහා -2" ත් ඇතැයි සිතමු. (ය/2 = ය, ර/2 = 6, ල/2 = 5, ව/2 = 2)

MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696